“මුස්ලිම්වරුන් දෙදෙනෙකු තම අසිපත්වලින් එකිනෙකා මුණ ගැසුණු විටෙක, ඝාතකයා සහ ඝාතනය කරනු ලැබූ තැනැත්තා යන දෙදෙනාම අපා ගින්නේ වෙති.”

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්රකාශයකට තමන් සවන් දුන් බව පවසා අබූ බක්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “මුස්ලිම්වරුන්
දෙදෙනෙකු තම අසිපත්වලින් එකිනෙකා මුණ ගැසුණු විටෙක, ඝාතකයා සහ ඝාතනය කරනු ලැබූ තැනැත්තා යන දෙදෙනාම අපා ගින්නේ වෙති.” මම: ‘අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! එය ඝාතකයා සම්බන්ධයෙනි. නමුත් ඝාතනය කරනු ලැබූ තැනැත්තාගේ තත්ත්වය කුමක් ද?’ යැයි විමසා සිටියෙමි. එතුමා: “සැබැවින් ඔහු ද තම සගයා ඝාතනය කිරීමේ අපේක්ෂාවෙන් පසු විය.”
[صحيح] [متفق عليه]

මුස්ලිම්වරුන් දෙදෙනෙකු ඔවුන් සෑම කෙනෙකුම අනෙකාව විනාශ කිරීමේ අදිටනින් තම අසිපත්වලින් එකිනෙකා මුණ ගැසුණු විටෙක, ඝාතකයා තම සගයාව ඝාතනය කළ හේතුවෙන් අපා ගින්නට පිවිසෙන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියේය. නමුත් ඝාතනයට ලක් වූ තැනැත්තා අපා ගින්නේ සිටිනුයේ කෙසේ දැයි සහාබාවරුන්ට ගැටලුවක් විය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඔහු ද තම සගයා ඝාතනය කිරීමේ අදිටනින් සිටියේය. එමෙන්ම ඝාතකයා ඉක්මන් වී ඔහුට කළින් ක්රියා කළ බැවින් මිස එසේ ඝාතනය කිරීමෙන් ඔහු වැළකුණේ නැත. එහෙයින් ඔහු ද අපා ගින්නෙහි වනු ඇතැයි පවසා සිටියහ.

https://sunnah.global/hadeeth/si/show/4304